# ඉබන් කල්දූන් හෙවත් සම්භාව්‍ය ඉස්ලාමීය සමාජ චින්තනයේ පුරෝගාමියා: ඉබන් කල්දූන්ගේ ජීවන පසුබිම හා ශාස්ත්‍රීය දායකත්වය පිළිබඳ සංක්ෂිප්ත සටහනක්

දිශාන් මධුශංක

## හැඳින්වීම

ගෝලීය ශාස්ත්‍රීය ප්‍රවාද තුළ බටහිර විද්‍යාව පෙරටුකරගත් දැනුමේ යම් ආධිපත්‍යමය ස්වභාවයක් පැවතිය ද එයට ව්‍යතිරේඛී ව පෙරදිග සමාජ තුළ ද විවිධ දැනුම් නිෂ්පාදන ප්‍රභවයන් හඳුනාගත හැකි වේ. විශේෂයෙන් ම ඉපැරැණි ආසියාතික ශිෂ්ටාචාර ඊට මනාව සාක්ෂ්‍ය සපයනු ලැබේ. වර්තමානයේ බටහිර විද්‍යාවෙන් අප වෙත සම්මුඛ කරන මිනිසාගේ සමාජීය ජීවිතය හා බැඳුණු විවිධ සංසිද්ධීන් පෙරදිග සිටින ලද විවිධ බුද්ධිමය පර්ෂදයන්ගේ ද දීර්ඝ සාකච්ඡාවට ලක් ව ඇත. බටහිරට සාපේක්ෂ ව පෙරදිග පරමත්වයෙහි ලා සැලකීම හෝ බටහිර දැනුම අද්විතීය ලෙස යම් ආන්තික කෝණයකින් අර්ථකථනය කිරීමට මෙහි දී බලාපොරොත්තු නො වේ. එහෙත් බටහිර දැනුම යම් බලය කේන්ද්‍ර කරගත් දැනුම් ආස්ථානයක් ලෙස මතුවත් ම ඊට සාපේක්ෂ ව පෙරදිග දැනුම හා සම්බන්ධ කතිකා හෝ මතිමතාන්තර යටපත් වීම සිදු වූ බව අවිවාදයෙන් යුතු ව පිළිගත හැකි කරුණකි **(Dhaouadi, 1990)**.

එමෙන් ම සම්භාව්‍යය ග්‍රීක හෝ රෝම චින්තන ධාරාවන් යළි පිබිදීමට ලක් වන්නේ මධ්‍යකාලීන යුගයේ ඇති වන දේශපාලන විසංවිධාන මගින් ය. මෙම දේශපාලන විසංවිධාන මගින් පසු කාලීන ව යුරෝපා පුනරුදයට අවශ්‍ය විෂය මූලික කොන්දේසි නිර්මාණය කළ ද ඒ තුළ තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කරන ලද්දේ සම්භාව්‍යය මුස්ලිම් චින්තන ධාරාවන් වේ. එනම් නූතනත්වය තුළ යුරෝපය දැනුමේ කේන්ද්‍රස්ථානය ලෙස මතුවත් ම මධ්‍යකාලීන යුගයේ මුස්ලිම් චින්තන ධාරා නො සලකා හැරීම හෝ බැහැර කිරීම සිදු වේ. එහෙත් සැබෑ ලෙස ම එම අවධිය මුස්ලිම් ශිෂ්ටාචාරීත්වයේ විභූතිය ප්‍රකාශ කෙරුණු අවධියක් ලෙස සඳහන් කළ හැකි වේ. මධ්‍යකාලීන මුස්ලිම්වරුන් විසින් ඉපැරැණි ග්‍රීක සහ රෝම පඨිතයන් හීබෲ, අරාබි සහ ලතින් වැනි නව භාෂාවන්ට පරිවර්තනය කරන ලදි. එ බැවින් පෙරදිග ශාස්ත්‍රීය දැනුම පිළිබඳ ව වන ගවේෂණයක දී මධ්‍යකාලීන මුස්ලිම් චින්තනය හා එහි විවිධ මතවාදාත්මක ධාරා මඟ හැර යා නො හැකි මාතෘකාවක් බවට පත් ව ඇත **(Dhaouadi, 1990)**.

සමාජවිද්‍යාව ලෙස අප අධ්‍යයන කරන විෂය ශාස්ත්‍රීය ශික්ෂණයක් ලෙස 19 වන සියවස මුල භාගයේ දී පමණ යුරෝපය කේන්ද්‍ර කරගනිමින් බිහි වන අතර මිනිසාගේ සමාජීය ජීවිතය විද්‍යාත්මක ව අධ්‍යයනය කිරීම ඉන් සිදු වේ. කෙසේ වෙතත් බටහිර ''සමාජවිද්‍යාව'' ලෙස විෂයක් බිහිවීමට පූර්වයේ සිට ම මිනිසාගේ සාමාජීය ජීවිතයේ විවිධ ගතිකත්වයන් විවිධ චින්තනමය සහ දාර්ශනික ගුරුකුලවල සාකච්ඡාවට ලක් ව ඇත. එම චින්තන හෝ දාර්ශනික ගුරුකුලයන් තමන් ව ඍජු ව සමාජවිද්‍යාඥයන් ලෙස හඳුන්වා නො දුන් නමුදු සමාජ විද්‍යාව විෂයක් ලෙස වර්ධනය වීමෙහි ලා ඉන් සපයන ලද දායකත්වය සුවිශේෂී වේ. සමාජ විද්‍යාවේ සම්භාව්‍යය න්‍යායධාරීන් ලෙස ස්ථානගත වන කොම්ට්, ඩර්ක්හයිම් සහ මාක්ස් හා සමාන ව පෙරදිග එනම් මධ්‍යකාලීන මුස්ලිම් චින්තන ධාරාවල ද මිනිසාගේ සමාජීය ජීවිතය පිළිබඳ විවිධ මතවාද ඉදිරිපත් කරන ලද චින්තකයන් හමු වේ **(Dhaouadi, 1990)**.

ඉබන් කල්දුන් මෙම සන්දර්භයේ ස්ථානගත වන්නේ මුස්ලිම් බුද්ධිමය ප්‍රවාද තුළ වඩාත් පුරෝගාමී පුද්ගල සාධකයක් ලෙස වේ. එනම් ඉබන් කල්දුන් 14 සියවසේ මැදපෙරදිග පහළ වූ අසහාය ලේඛකයෙකු ලෙස ද අද්විතීය චින්තකයකු ලෙස ද හඳුනාගන්නා අතර ඔහු මුස්ලිම් බුද්ධිමය ධාරා අතර පහන් ටැඹක් බඳු ය. ඉබන් කල්දුන් විසින් සපයන ලද ශාස්ත්‍රාලෝකයෙන් ප්‍රබෝධමත් වූයේ හුදෙක් මුස්ලිම් ශාස්ත්‍රීය ලෝකය පමණක් නො වේ. බටහිර විද්වතුන් ද ඉබන් කල්දුන්ගේ ආගමනය සමඟ ඔහු විසින් අවධාරිත ශාස්ත්‍රීය මතවාද කෙරෙහි අවධානය යොමුකරන ලදි. මිනිසාගේ සමාජීය ජීවිතය ඇතුළු ඓතිහාසික කාරණා මෙන් ම බල දේශපාලනික සංසිද්ධීන් කෙරෙහි වඩාත් අවධානය යොමු කළ කල්දුන් ඒවා වඩාත් විචාරාත්මක දෘෂ්ටියකින් යුතු ව විවරණය කර ඇත **(Soyer & Gilbert, 2012)**.

සැබෑ ලෙස ම ඉබන් කල්දුන් පිළිබඳ ශාස්ත්‍රීය සාකච්ඡාවක් මේ මොහොතේ අප ඇරඹිය යුත්තේ ඇයි? යන ප්‍රශ්නය වඩාත් ගැඹුරින් විමසා බැලිය යුත්තකි. වර්තමානයේ සමාජ විද්‍යාත්මක විෂය ධාරාව තුළ අප සාකච්ඡාවට ලක් කරන බොහෝ සංකල්ප ඉබන් කල්දුන්ගේ සාකච්ඡා සහ විග්‍රහ තුළ ද හඳුනාගත හැකි වේ. බටහිර සමාජ විද්‍යාව වර්ධනය වීමෙහි ලා කල්දුන්ගේ මෙම බුද්ධිමය ධාරාවන් ඍජු ව බලපා තිබේ ය යන පොදු සාමාන්‍යකරණය වෙත අපට එළඹිය නො හැකි නමුදු මෙයින් සපයා ඇති අවකාශය සුළුපටු නො වේ. එනම් ඉහතින් මතුකර ඇති ආකාරයට බටහිර හා සමාන ව පෙරදිග සමාජීය චින්තනයේ ස්වභාවය කෙබඳු වී ද යන පැනය විමසන්නෙකුට මින් සැපයෙන ශාස්ත්‍රීය උත්තේජනය සුළුපටු නො වේ. අනෙක් අතට පෙරදිග ඇතුළු ඉස්ලාම් ශාස්ත්‍රීය ලෝකය සම්බන්ධයෙන් නිර්මිත දුර්මත සඳහා ඉබන් කල්දුන් සහ ඔහු අවධාරිත මතවාද කදිම පිළිතුරක් ද වේ **(Soyer & Gilbert, 2012)**.

එම අර්ථයෙන් මෙම ලිපියේ ඉබන් කල්දුන් පිළිබඳ මූලික සාකච්ඡාවක් නොහොත් පූර්විකාමය හැඳින්වීමක් ඉදිරිපත් කර ඇති අතර ඔහුගේ ජීවන පසුබිම, කල්දුන් හට චින්තකයෙකු ලෙස මතුවීමට බලපෑ ඓතිහාසික මූලයන් සහ

කල්දූන්ගේ ශාස්ත්‍රීය දායකත්වය පිළිබඳ යම් ආරම්භක සාකච්ඡාවක් ඉදිරිපත් කර ඇත. ඉබන් කල්දූන් මතු කරන ලද චින්තනමය හා දාර්ශනික ප්‍රවාද පිළිබඳ ඉදිරියේ වඩාත් ගැඹුරු තලයේ සාකච්ඡාවකට අවශ්‍ය වන පූර්වෝක්ත මඟ පෙන්වීම මෙම ලිපියෙන් සපයා දී තිබේ.

## ඉබන් කල්දූන්ගේ ජීවන පසුබිම

අබු සයිද් අබ්දුල් රහමාන් ඉබන් කල්දූන් නැතහොත් වඩාත් ජනප්‍රිය අර්ථයෙන් ඉබන් කල්දූන් 1332 මැයි මස 27 දින ටියුනීසියාවේ උපත ලැබූ අතර අධ්‍යාපනය සහ දේශපාලනය යන ක්ෂේත්‍ර දෙකෙහි ම යම් කීර්තියක් අත්පත් කරගත් සම්භාව්‍ය යෙමිනිට් අරාබි පවුල් පසුබිමකට ඔහු අයත් වේ. කල්දූන් බින් අල් කටාබ්ගෙන් ඇරඹෙන ඔහුගේ ආදි අරාබි මුතුන් මිත්තන් වන භානු කල්දූන්වරුන් අටවන සියවසේ දී පමණ ස්පාඤ්ඤයේ ඇන්ඩලූසියාව වෙත සංක්‍රමණය වී ඇත. එම අවධිය ස්පාඤ්ඤ දේශපාලනයේ උග්‍ර මතභේදතා උත්පන්න වූ අවධියක් ලෙස සැලකෙන අතර එහි දී ඇති වන දේශපාලන විසංවිධාන හේතුවෙන් ස්පාඤ්ඤ ඉස්ලාමීය බලය පරිහානියට පත් වීම සිදු වේ. මෙහි ප්‍රතිඵලය වූයේ සෙවිල් පාලනයේ ඇදවැටීමත් සමඟ කල්දූන්වරුන් ටියුනීසියාව වෙත සංක්‍රමණය වීම යි. කල්දූන් පවුලේ සාමාජිකයන් එවකට පැවති ටියුනීසියානු හෆ්සීඩ් රාජ්‍යය පාලනය තුළ යම් දේශපාලන ආස්ථානයක නිරත වූ නමුත් පසු කාලීන ව ඔහුගේ පියා සහ මිත්තණිය දේශපාලන ආස්ථානයෙන් මිදී යම් අප්‍රසිද්ධ සමාජීය ජීවිතයකට යොමුවන ලදි **(Fuad, 1988)**.

ටියුනීසියානු දේශපාලනයේ ඇති වන අර්බුද හේතුකොටගෙන කල්දූන්වරු අනතුරු ව මොරොක්කෝව වෙත සංක්‍රමණය වන අතර ඉබන් කල්දූන්ගේ පසු කාලීන නිජබිම බවට පත් වන්නේ මොරොක්කෝව පෙරටුකරගත් උතුරු අප්‍රිකානු ජීවිතය වේ. සැබෑ ලෙස ම උතුරු අප්‍රිකානු කලාපයේ ඉබන් කල්දූන් ගත කළ මෙම ජීවිතය විවිධ දේශපාලන අස්ථාවරත්වයන්ගෙන් පිරුණු, බුද්ධිමය වශයෙන් අවපාත අවධියක් ලෙස සඳහන් කළ හැකි ය. එනම් එක් අන්තයකින් එවකට උතුරු අප්‍රිකාවේ පැවති මුස්ලිම් අධිරාජ්‍ය ශීඝ්‍ර කඩාවැටීමකට ලක් වෙමින් පැවති අතර එහි ප්‍රතිඵලයක් ලෙස බිහි වූ කුඩා රාජ්‍යයන් ගණනාවක් එකිනෙකා අතික්‍රමණය කරමින් තියුණු දේශපාලන අරගලයක නියුතු ව සිටියහ. දේශපාලන කුමන්ත්‍රණ, පසමිතුරුතා, කැරලිගැසීම් හා එදිරිවාදීකම් මෙම අවධියේ හඳුනාගත හැකි වූ දේශපාලන සංලක්ෂයන් වන අතර දේශපාලන බල ගැටුම් සඳහා අවැසි සරුපසක් ඒ මගින් නිර්මාණය ව පැවතුණි **(Fuad, 1988)**.

මෙ වැනි දේශපාලන හා සමාජ වාතාවරණයක උතුරු අප්‍රිකාවේ වඩාත් දක්ෂ ගුරුවරුන්ගෙන් ඉබන් කල්දූන් සිය මූලික අධ්‍යාපනය ලබන අතර එහි දී සාම්ප්‍රදායික අරාබි අධ්‍යාපනයක් ලබයි. විශේෂයෙන් ම අරාබි වාග්විද්‍යාව සහ කුරානය ඇතුළු අරාබි නීතික්‍රම පිළිබඳ හසළ දැනුමක් ලබාගන්නා කල්දූන් ගණිතය, කාව්‍යය ශාස්ත්‍රය, තර්ක ශාස්ත්‍රය වැනි විෂයන් ද හදාරා ඇත **(Fuad, 1988)**.

ඉබන් කල්දූන් දාර්ශනිකයෙකු හා චින්තකයෙකු ලෙස මතුවීමට බලපෑ ප්‍රධානතම කරුණ වූයේ ඔහු විසින් ලබාගන්නා ලද මෙම අධ්‍යාපනය වේ. එ මෙන් ම විධිමත් අධ්‍යාපනයට අමතර ව ඔහු විසින් ගෝත්‍රිකයන් සහ විවිධ ආගමික නායකයන් සමඟ පවත්වන ලද සමීප ඇසුර ද මෙහි ලා අවධාරණය කළ හැකි අතර එහි දී උතුරු අප්‍රිකානු ගෝත්‍රයක් වූ බානු අරීෆ් ගෝත්‍රයේ වඩාත් ජනප්‍රිය පුද්ගලයෙකු බවට පත්වීමට ඉබන් කල්දූන් සමත් වේ. ඉස්ලාම් ආගම හා බැඳුණු නීතික්‍රම පිළිබඳ ඔහු ලැබූ විචක්ෂණ දැනුම පසු කාලීන ව ඔහුට ප්‍රබල දේශපාලන ක්‍රියාකාරිකයෙකු ලෙස මතුවීමට අවශ්‍ය විභවය නිර්මාණය කරන ලදි **(Fuad, 1988)**.

## ඉබන් කල්දූන් සක්‍රීය දේශපාලන ක්‍රියාකාරිකයෙකු ලෙස

දේශපාලනය හෝ දේශපාලන සංසිද්ධීන් ඉබන් කල්දූන්ට නව මාතෘකා නො වූ අතර කුඩා කළ සිට ම විවිධ දේශපාලනික හැල හැපීම් හමු වේ වින්දිතයෙකු වීමට ඔහුට සිදු ව ඇත. මෙම හේතුව නිසා ම සිය ජීවිතයේ විසිවැනි වියට පා තැබීමටත් පෙර ම ඔහු පොදු මහජන අවකාශය වෙත අවතීර්ණ වේ. ඔහු සිය වෘත්තීය ජීවිතය ආරම්භ කර ඇත්තේ අභිලේඛන ශිල්පියෙකු ලෙස හෙවත් මුද්‍රා තබන්නෙකු ලෙස ය. මෙම වෘත්තීය ඔහු අයත් කල්දූන් පරම්පරාවේ කිසිවකුත් නියුතු නො වූ වෘත්තීයක් ලෙස ද සැලකේ. මෙහි දී රාජ්‍යය ලේඛන ප්‍රසම්පාදනය කිරීම හා එහි නෛතික කටයුතු විමර්ශනය කිරීම ඔහුගේ වෘත්තීය තුළ ප්‍රමුඛ වූ බව කියවේ**(Fuad, 1988)**.

කෙසේ වෙතත් ඉබන් කල්දූන්ගේ අභිලාෂයන් යොමුව පැවතියේ සක්‍රීය දේශපාලනය කෙරෙහි වේ. එනම් ඒ මොහොතේ ක්‍රියාත්මක වෙමින් පැවති දේශපාලන කුමන්ත්‍රණ සහ බල අරගල ඔහුගේ තියුණු නිරීක්ෂණාක්ෂියට ලක් විය. එහි එක් උච්චතම අවස්ථාවක් වන්නේ ඉබන් කල්දූන් පවත්නා දේශපාලන බලාධිකාරයට එරෙහි ව කුමන්ත්‍රණයක් දියත් කිරීමට මැදිහත්වීම යි. එම කුමන්ත්‍රණයේ ප්‍රධාන මතවාදී දායකත්වය ලබා දීම හේතුවෙන් කල්දූන් හට දෙවසරක සිර දඬුවමකට යටත්වීමට ද සිදු වේ.

සිරෙන් නිදහස් වන කල්දූන් නැවතත් සුපුරුදු සක්‍රීය දේශපාලනය තුළ නිරත වේ. එනම් ඔහු රාජ්‍යය සහ අධිකරණ ලේකම්වරයෙකු ලෙස මතුවීම සිදු වේ. කල්දූන් සතු නෛතික දැනුම හා දේශපාලන පරිණතභාවය හේතුවෙන් ඔහුට විවිධ රාජ්‍ය පාලකයන්ගෙන් ඇරයුම් ඉදිරිපත් වීම සිදු වේ. ඉබන් කල්දූන් ග්‍රැනඩාහි අධිකරණ ලේකම් ධුරයට පත් වන්නේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. ග්‍රැනඩාවේ මුස්ලිම් සුල්තාන්වරයාට ඉබන් කල්දූන් කොතෙක් වැදගත් වී ද යත් ඔහු සිය මිත්‍රත්වයේ දෑත් කල්දූන් වෙත දිගුකරමින් ග්‍රැනඩාවේ ඉහළ දේශපාලන පිළිගැනීමක් ඔහු වෙත ලබාදේ. එමෙන් ම ඒ මොහොතේ ග්‍රැනඩාවට දේශපාලනික ව ප්‍රතිපක්ෂ කඳවුරක පිහිටි, කෲර ක්‍රිස්තියානි පාලකයෙකු බලය හෙබ වූ කැස්ටිල් වෙත ඉබන් කල්දූන් රාජ්‍යය දූතයෙකු හෙවත් අධිකරණ තානාපතිවරයෙකු ලෙස පත් කරනු ලබයි. මේ මගින් කැස්ටිල් හා ග්‍රැනඩාව අතර පවත්නා දේශපාලන විසම්මුතිය නිමා කිරීමට ද අපේක්ෂා කරන ලදි**(Fuad, 1988)**.

කෙසේ වෙතත් මෙහි දී සිදු වූයේ කැස්ටිල්හි ක්‍රිස්තියානි පාලකයා ද ඉබන් කල්දූන් කෙරෙහි පැහැදෙමින් ඔහුව සිය පාර්ශ්වය වෙත දිනාගැනීමට උත්සාහ දැරීම යි. ඒ සඳහා සෙවිල් නම් ප්‍රදේශයේ කල්දූන්වරුන් මීට පෙරාතුව භාවිත කරන ලද ප්‍රදේශ ලබාදුන් නමුත් ඉබන් කල්දූන් ඒවා ප්‍රතික්ෂේප කරන ලදි. මෙම තත්වය තුළ ග්‍රැනඩාහි පාලකයා ද ඉබන් කල්දූන්ගේ අධිකරණමය බලය වැඩිවීම සම්බන්ධයෙන් අප්‍රසාදය පළ කරන ලදි. මෙම කාලයේදී උතුරු අප්‍රිකානු හැෆ්සයිඩ් පාලකයා ද සිය රාජ්‍යයේ අග්‍රාමාත්‍ය ධුරය භාරගන්නා ලෙස ඉල්ලා සිටින ලද අතර කල්දූන් එම ඉල්ලීම පිළිගත් බව කියවේ**(Fuad, 1988)**.

අභිලේඛන ශිල්පියෙකු ලෙස මෙන් ම පසු ව අධිකරණ ලේකම්වරයකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කරමින් පසු ව විවිධ දේශපාලනික බල අරගලවල සක්‍රීය සහ මතවාදී ක්‍රියාධරයෙකු බවට පත් වූ ඉබන් කල්දූන් ඉන් අනතුරු ව සක්‍රීය දේශපාලන ක්‍රියාකාරීත්වයෙන් ඉවත් ව බානු අරීෆ් නම් ගෝත්‍ර ප්‍රජාව කෙරෙහි වඩාත් අවධානය යොමුකරන ලදි. එනම් ගෝත්‍ර ප්‍රජාව සමඟ වඩාත් කුළුපග ව කටයුතු කරමින් ඔවුන් දේශපාලනික වශයෙන් අවබෝධාත්මක තත්වයකට පත් කිරීම කල්දූන් අතින් සිදුවේ**(Fuad, 1988)**.

දේශපාලනයෙන් ඉවත් ව ඔහු ගත කළ ඒකාකාරී ජීවිතයෙන් මිදීම සඳහා ඉබන් කල්දූන් විසින් නැවත සිය මුල් නිජබිම වූ ටියුනිසියාවට යෑමට තීරණය කරන ලදි. එහි දී කල්දූන් එවකට ටියුනීසියානු පාලකයාව සිටි සුල්තාන්වරයාට ලිපියක් යවමින් ඔහුගේ පාලනයට එරෙහි ව ගෝත්‍රිකයන් මෙහෙයවීම සම්බන්ධයෙන් හේතු දක්වන අතර ඊට සමාව ඉල්ලමින් ටියුනීසියාව තුළ ශාස්ත්‍රීය වැඩකටයුතු කිරීමට අවශ්‍ය ඉඩ සහ අවසරය ඉල්ලා සිටින ලදි. මෙහි දී සුල්තාන්වරයා එම ඉල්ලීම් හා එකඟ වීම වඩාත් සුවිශේෂී වේ. මෙම අවධිය තුළ ඉබන් කල්දූන් තවත් අවාසනාවන්ත සිදු වීමකට මුහුණපානු ලබයි. එනම් ඔහු හා එකතුවීමට ටියුනීසියාවේ සිට පැමිණි ඔහුගේ පවුලේ සාමාජිකයන් ඇතුළු නැව ඇලෙක්සැන්ඩ්‍රියාව අසල දී සම්පූර්ණයෙන් මුහුදුබත් වීම යි **(Fuad, 1988)**.

කෙසේ වෙතත් තමා අපේක්ෂා කළ ආකාරයේ ශාස්ත්‍රාලීය ජීවිතයක් ආරම්භ කිරීමට අවශ්‍ය ඉඩකඩ ඉබන් කල්දූන් වෙත නො ලැබේ. එනම් ටියුනීසියාවට යෑමෙන් අනතුරු ව ඔහු ආරම්භ කිරීමට ගිය ජීවිතය සාර්ථක නො වේ. ඉපැරණි කල්දූන් නිවසේ ඔහු විඳි විවේකි සුවය එහි නො වූ අතර ඔහුගේ ඇතැම් මිතුරන් ලෙස කටයුතු කළ අය පවා ඔහුට එදිරිවාදී ව කටයුතු කරන ලදි. සක්‍රීය දේශපාලනයෙන් තාවකාලික ව හෝ සමුගැනීමට කල්දූන් අපේක්ෂා කළ ද එයට තිත තබමින් ටියුනීසියානු සුල්තාන්වරයා සිය විරුද්ධවාදීන්ට එරෙහි ව ගෙන යන සටන සඳහා තමාට සහාය වන ලෙස කල්දූන්ගෙන් ඉල්ලා සිටින ලදි. මෙම දේශපාලන බල අරගල සම්බන්ධයෙන් අප්‍රසාදයට පත් වන කල්දූන් ඉන්පසු සංචාරක ජීවිතයක් වෙත අවතීර්ණ වේ. එනම් ටියුනීසියාවෙන් පිටවන ඔහු ඇලෙක්සැන්ඩ්‍රියාව වෙත ගමන් කරන ලද අතර මක්කම වෙත යන ගමනේ දී ඔහුව වඩාත් අමන්දානන්දයට පත් කරන ලද රාජ්‍යයක් වූ ඊජිප්තුව වෙත පැමිණේ **(Fuad, 1988)**.

එහි දී කයිරෝවේ ඉස්ලාමීය පල්ලි ආශ්‍රිත අධ්‍යයන කවයන් තුළ කල්දුන් ගුරු භූමිකාවේ නිරත වන අතර විවිධ සමාජ සංසිද්ධීන් අළලා ඔහු විසින් ප්‍රකාශිත විචිත්‍රවත් දේශනා ඔහුගේ අනුගාමික සිසුන් විසින් විස්මයෙන් යුතු ව වැලඳගන්නා ලදි. ඉන් අනතුරු ව ඉබන් කල්දුන් හට වඩාත් හුරු පුරුදු වෘත්තීය වන විනිශ්චයකාර වෘත්තීයෙහි නියැළීමට සිදු වේ. මෙහි දී කල්දුන් සිය පැරණි දේශපාලන භාවිතාවන් යොදාගනිමින් විවිධ පාලන තන්ත්‍ර වෙනස් කිරීමට කටයුතු කරනු වෙනුවට දැඩිභාවයකින් සහ අවංකත්වයෙන් යුතු ව අධිකරණමය සේවාවන් ඉටුකළ බව කියැවේ. ඔහුගේ මෙම අපක්ෂපාතී හා අවංක සේවා සැපයීම හේතුවෙන් කලින් දේශපාලනික ව පසමිතුරු වූ ආකාරයට ම බොහෝදෙනා සතුරු වූ අතර 1384 දී පමණ කල්දුන් හට අධිකරණමය සේවාවන්ට සමුදීමට ද සිදුවේ **(Fuad, 1988)**.

සිය පවුලේ සාමාජිකයන් අකාලයේ මරණයට පත්වීම සහ දේශපාලනික ව හෝ මතවාදාත්මක වශයෙන් ඔහුට ප්‍රතිපක්ෂ සතුරන් බිහිවීම වැනි බාධක මධ්‍යයේ පවා කල්දුන් ශාස්ත්‍රීය අධ්‍යාපනය කෙරෙහි අවධානය යොමුකරන ලදි. කල්දුන්ගේ ශාස්ත්‍රීය දැනුම හා අධිකරණ සේවා පිළිබඳ ඔහුගේ අසහාය අත්දැකීම්හි ප්‍රතිඵලයක් වශයෙන් ඊජිප්තු සහිරියා විශ්වවිද්‍යාලයේ අධිකරණ විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙකු ලෙසට කල්දුන් පත් කෙරේ. 1387 ඉබන් කල්දුන් අපේක්ෂා කළ ආකාරයට ඔහුට මක්කම වෙත යෑමට අවකාශය උදා වේ. සිය වන්දනා හෙවත් සංචාරක ගමන නිමාකිරීමෙන් අනතුරු ව ඔහු ඊජිප්තු බෙයිබාර්ස් ආයතනයේ සභාපතිවරයා ලෙස ද පත්කෙරේ**(Fuad, 1988)**.

කල්දුන් සිය ජීවිතයේ අවසාන භාගයයේ ද සක්‍රීය දේශපාලන ක්‍රියාකාරීකයෙකු ලෙස කටයුතු කර ඇත. එනම් 1400 දී පමණ කැරලිකරුවකු වූ තිමෝර්ගේ නායකත්වයෙන් යුත් හමුදාවක් සිරියාව ආක්‍රමණය කරන ලද අතර එවකට සිරියාවේ සිටි සුල්තාන්වරයා ආක්‍රමණික කැරලිකරුවන්ට එරෙහි ව තමා සමඟ එකතු වන ලෙස කල්දුන් හට ආරාධනා කර තිබේ. මෙහි දී සුල්තාන්වරයා විසින් ඉබන් කල්දුන් ඩමස්කස් නුවර රඳවා ඊජිප්තුව වෙත පලා ගොස් ඇති අතර කල්දුන් සහ කැරලිකරුවන් අතර යම් සම්මුතියක් ඇති කිරීම ඉන් අපේක්ෂා කරගන්නා ලදි. මෙහි දී තිමෝර් සහ කල්දුන් අතර දීර්ඝ දේශපාලන සාකච්ඡා ඇති වන අතර එම සාකච්ඡා පදනම් කරගනිමින් කල්දුන් සිරියාව ප්‍රමුඛ උතුරු අප්‍රිකානු දේශපාලනය පිළිබඳ ව නිබන්ධයක් සම්පාදනය කළ බව කියවේ. නැවත ඊජිප්තුව වෙත යෑමෙන් අනතුරු ව තිමෝර් හා සාකච්ඡා කරන ලද ප්‍රවාද කල්දුන් විස්තරාත්මක ස්වරූපයෙන් ලියා ඇති අතර එහි පිටපතක් ටියුනීසියාවේ සුල්තාන්වරයාට ද ඉදිරිපත් කර ඇත **(Soyer & Gilbert, 2012)**.

ඉබන් කල්දුන් සයවන වරටත් අධිකරණ විනිශ්චයකර ධුරය සඳහා සිය නාමයෝජනා ඉදිරිපත් කර කෙටි කාලයකට පසු ව එනම් 1406 දී මරණයට පත් ව ඇත. ඉබන් කල්දුන්ගේ අභාවයත් සමඟ ඔහුගේ බුද්ධිමය දායකත්වය සහ ඔහු සතු අසහාය ගති ලක්ෂණ පසු කාලීන විචාරවාදීන්ගේ ඇගයුමට ලක් ව ඇත. ඉබන් කල්දුන් සතු සුවිශේෂී ගති ලක්ෂණයක් ලෙස ඔහු සතු වාක් චාතුර්යෙන් චතුර

කථිකත්වය අවධාරණය වේ. විශේෂයෙන් ම මෙම කථිකත්වය හේතුවෙන් බොහෝ පාලකයන් ඉබන් කල්දූන් තම දක්ෂය වෙත දිනාගැනීමට කටයුතු කර ඇත. කල්දූන් සිය වාක්චාතුර්ය මගින් ආකර්ශනය කරගන්නා ලද්දේ හුදෙක් පාලකයන් පමණක් නො වේ. ඉහතින් ද අවධාරිත ආකාරයට ඔහුගේ දේශනාවන්ට සවන් දුන් ශිෂ්‍යයන් මෙන් ම ගෝත්‍ර සහ ආගමික නායකයන් ද ඒ අතර වේ. එනම් කැස්ටීලයේ කෲර රජු, තිමෝර් ආක්‍රමණිකයා ඇතුළු දේශපාලන ප්‍රවාහයේ සිට පොදුවේ සාමාන්‍ය ජනයා දක්වා පිරිස් ඔහුගේ වාග් විලාසය වටා එකතු වූ බව කියවේ. එ මෙන් ම කිසියම් සංසිද්ධියක් හෝ අර්බුදයක් විස්තරාත්මක සාකච්ඡාවට ලක් කරමින් එයින් විසඳුම්වලට එළඹීම ද ඔහුගේ ප්‍රධාන ගතිලක්ෂණයක් ලෙස අවධාරණය වේ **(Fuad, 1988)**.

එ මෙන් ම කල්දූන්ගේ දේශපාලන සතුරන් පවා අගය කළ අසහාය චරිත ලක්ෂණයක් වූයේ ඔහු සතු අවංකත්වය යි. විශේෂයෙන් ම කල්දූන් විසින් සම්පාදිත ලේඛනවලින් ඔහු සතු අවංකත්වය මනාව විද්‍යමාන වේ. ලෞකිකත්වය පිළිබඳ ඔහු විසින් විරචිත විස්තරාත්මක ග්‍රන්ථයට පරිබාහිර ව ඔහු විසින් සම්පාදිත ස්වයං චරිතාපදානය ද ප්‍රයෝගාලංකාරයෙන් සහ අනවශ්‍ය වර්ණනයන්ගෙන් තොර වේ. ඉබන් කල්දූන් විසින් සම්පාදිත මෙම චරිතාපදානය ඔහුගෙන් පසු කාලීන ලේඛකයන් හට වඩාත් විස්මයජනක සහ පහදාදිය නො හැකි ප්‍රපඤ්චයක් බවට පත් වේ **(Fuad, 1988)**.

තමා සම්බන්ධ මෙ තරම් අවංක සහ ඍජු ලේඛනයක් සම්පාදනය කිරීමට තරම් කල්දූන් නිර්භීත වූයේ ඇයි ද යන්න පැහැදිලි කිරීමට මේතාක් කිසිදු ලේඛකයෙක් සමත් ව නැත. ඉබන් කල්දූන් වඩාත් පෙනී සිටියේ ප්‍රඥාව උදෙසා වේ. සියල්ලන් තුළින් ම වරදක් දැකිය හැකි බව අවධාරණය කරන ඔහු වරදක් නොමැති පුද්ගලයෙක් නොමැති බව මතු කරයි. එ මෙන් ම ඔහු සිය දේශපාලන හැසිරීම් ගැන ලැජ්ජා නොවෙමින් පෙන්වාදෙන්නේ මිනිසුන් සෑමවිට ම ඒකරූපි නො වන බව යි. එනම් මිනිස් ජීවිතය තුළ එක් අන්තයකින් අතිශයෝක්තිය පවතින්නේ යම් සේ ද චපලත්වය ද මිනිස් ජීවිතයේ පවත්නා නිත්‍ය අංගයක් ලෙස ඔහු පෙන්වා දේ. ඉබන් කල්දූන්ගේ අවංකත්වය අගය කළ ඔහුගේ උග්‍ර සතුරකු වන අල්-සක්හවි පෙන්වා දෙන්නා ඉබන් කල්දූන් යනු මැනවින් සාධාරණත්වය නියාමනය කළ පුද්ගලයෙක් බව යි. එ මෙන් ම වොන් වෙසෙන්ඩොන්ක් පෙන්වා දෙන්නේ ඉබන් කල්දූන් සිය ජීවිතයේ ආරම්භයේ සිට ම අවසානය දක්වා ම දැනුම උදෙසා ක්‍රියා කළ බව යි. ඔහු මතු කරන ආකාරයට කල්දූන් අවංක සහ උසස් ප්‍රතිපත්තීන්ගෙන් අනූන මිනිසෙකි**(Fuad, 1988)**.

මෙ ලෙස ඉබන් කල්දූන්ගේ ජීවන පසුබිම, වෘත්තීය ජීවිතය සහ දේශපාලන සංසිද්ධිවල ඔහු සක්‍රීය ව ඉටු කරන ලද කාර්යභාරය විමසා බැලිය හැකි අතර ඔහු චින්තකයෙකු සහ බුද්ධිමතෙකු ලෙස දක්වන ලද ශාස්ත්‍රීය දායකත්වය සැකෙවින් සාකච්ඡාවට ලක් කළ යුතු වේ.

## ඉබන් කල්දූන්ගේ ශාස්ත්‍රීය දායකත්වය

යුරෝපීයන් ප්‍රථමවරට ඉබන් කල්දූන් ශාස්ත්‍රවේදියෙකු, බුද්ධිමතෙකු සහ දේශපාලන ක්‍රියාධරයෙකු ලෙස හඳුනාගනු ලබන්නේ 19 වන සියවසේ දී පමණ වේ. එහෙත් ඉබන් කල්දූන්ගේ ශාස්ත්‍රීය වැදගත්කම විමසා බැලීමේ දී එය 14වන සියවස දක්වා විහිදේ. ඉබන් කල්දූන්ගේ ශාස්ත්‍රීය ජීවිතය ගවේෂණය කිරීමේ දී වර්ෂ 1377 දී ඔහු විසින් විරචිත **මුඛඩිම්මා** ග්‍රන්ථය ඓතිහාසික සහ සමාජ වැදගත්කමකින් අනූන ග්‍රන්ථයක් ලෙස අවධාරණය කළ හැකි වේ. මෙය කල්දූන් ශාස්ත්‍රීය බුද්ධිමතෙකු ලෙස පරිපාකයට පත් වූ අවධියේ විරචිත ග්‍රන්ථයක් ලෙස ද සඳහන් වේ. එනම් **මුඛඩිම්මාව** ඔහුගේ ස්වයං චරිතාපදානයක් ලෙස මෙන් ම ඉතිහාසය ප්‍රමුඛ කොටගත් සමාජ-දාර්ශනික කාරණා පිළිබඳ විචාරවාදයක් ලෙස ද සැලකේ **(Soyer & Gilbert, 2012)**.

ඉබන් කල්දූන් මේ මගින් සම්මුඛ කෙරෙන අදහස් සහ දෘෂ්ටීන් එකිනෙකට සාපේක්ෂ වන අතර ඒවා ගතිකත්වයෙන් අනූන වේ. එනම් අප සත්‍ය ලෙස සංජානනය කරගනු ලබන ඒකරූපී ඡායාවක් නොමැත. එය එකිනෙකට වෙනස් දෘෂ්ටීන්ගෙන් විමසා බැලෙන සංකීර්ණ සංසිද්ධියක් වේ. යමෙකු පිරමීඩයක් දෙස බලා සාමාන්‍යකරණයන්ට එළඹෙන්නේ ඔහු හෝ ඇය පිරමීඩයේ දකින තලයන් අනුරූප ව වේ. එලෙස සත්‍ය ද වටකුරු සරල සංසිද්ධියක් නො වේ. **මුඛඩිම්මාව** ප්‍රමුඛ කරගත් කල්දූන්ගේ ශාස්ත්‍රීය ලේඛනවල උක්ත සංකීර්ණ ස්වභාවය හඳුනාගත හැකි වේ. එනම් ඉබන් කල්දූන් සමාජ සංසිද්ධීන් විවරණය කර ඇත්තේ ගතික දෘෂ්ටිකෝණයකින් වේ. එක ම සංසිද්ධියක කෘත්‍ය, දුස්කෘත්‍ය මෙන් ම ප්‍රයෝජනවත් මෙන් ම හානිදායක දේ අඩංගු විය හැකි ය**(Soyer & Gilbert, 2012)**.

නිදර්ශන වශයෙන් කල්දූන් අරාබිවරුන් ප්‍රශංසා කරන අතරවාරයේ ම ඔවුන් මිලෙච්ඡයන් ලෙස ද පෙන්වාදේ. ඉබන් කල්දූන්ට අනුව මිලෙච්ඡත්වය යනු ජීවන විලාසයක්, සිතීමේ ආකාරයක් හෝ හැසිරීමක් විය හැකි අතර එය හුදෙක් නිෂේධනීය අර්ථයක් සපයන්නක් නො වේ. එය පුරුෂත්වය, නිදහස, නිර්භීතකම හා උඩඟුකම යන අවශේෂ සංකල්ප හා සමාන වේ.

එ මෙන් ම ඉබන් කල්දූන් සිය ශාස්ත්‍රීය වැඩකටයුතුවල ස්වාධීන ප්‍රවේශයක් අනුගමනය කළ චින්තකයෙකු වශයෙන් ද සැලකේ. එනම් කල්දූන් හට ඔහුට පෙරාතු ව සිටි ශාස්ත්‍රීය වියතුන්ගේ ආභාසය හිමි වූ නමුත් එම වියතුන්ගේ ඉදිරි ප්‍රකාශනයක් බවට පත් නො වී ඔහු නවාත්මක සහ තමාට ම ආවේණික සිතුවිලි ධාරාවන් ඉදිරිපත් කරන ලදි. එ මෙන් ම ඉබන් කල්දූන් චින්තකයෙකු ලෙස හුදෙක් ඉස්ලාමීය බුද්ධිමය ධාරාව තුළ පමණක් ලඝු කළ හැකි ද යන පැණය මතුව තිබේ. ඔහු ඉස්ලාම් ජාතිකයෙකු වුව ද මධ්‍යකාලීන අන්තගාමී ඉස්ලාමීය අදහස්වලට ඉඳුරා ම විරුද්ධ වූ අයෙකු ලෙස සැලකේ. එබැවින් ඉස්ලාමීය අනන්‍යතාව ඔහුගේ බුද්ධිමය දායකත්වය හඳුනාගන්නා එකම නිර්ණායකය නො වන බව මෙහි ලා අවධාරණය කළ හැකි වේ **(Dhaouadi, 1990)**.

ඉබන් කල්දූන්ගේ අවධානය යොමු වූ තවත් ක්ෂේත්‍රයක් වන්නේ සමාජ සංවිධාන සහ මානව ශිෂ්ටාචාර ක්‍රියාවලිය යි. ඔහු විසින් විරචිත 'ඉම්-අල්-උම්රාන්' නමැති ශාස්ත්‍රීය පඨිතය හුදෙක් දේශපාලන සංසිද්ධි පිළිබඳ විග්‍රහයක් නො වන අතර එය සමාජ සංවිධාන සහ ශිෂ්ටාචාරී ක්‍රියාවලිය පිළිබඳ ව විවරණය කරන්නක් ද වේ. එමෙන් ම මිනිසාගේ දේශපාලන හා සමාජ ජීවිතය පිළිබඳ ඔහුගේ මෙම විවරණය සමාජ ව්‍යූහයට අදාළ ව ඉදිරිපත් කරන ලද්දකි**(Fuad, 1988)**.

ඉබන් කල්දූන් 14 වන සියවසේ මතු වූ බුද්ධිමතෙකු ලෙස හඳුනාගත්ත ද ඔහු විසින් අවධාරිත ශාස්ත්‍රීය සාකච්ඡා සමකාලීන බටහිර ප්‍රවාද හා සන්සන්දනාත්මක ව යොදාගැනීම නිරීක්ෂණ කළ හැකි වේ. එනම් සමාජ විද්‍යාව ඇතුළු අද්‍යතන විෂය ධාරාවල සාකච්ඡාවට නතු කෙරෙන සමාජ සංවිධාන, සමාජ ගතිකත්වය, දේශපාලනය මෙන් ම සමාජ ව්‍යූහය වැනි න්‍යායික ප්‍රස්තුත කල්දූන්ගේ සාකච්ඡා සහ ලේඛනවල දැකිය හැකි වේ. එමෙන් ම ඉබන් කල්දූන් උතුරු අප්‍රිකාව සම්බන්ධයෙන් පළ කරන ලද න්‍යායික අදහස් ද යුරෝපීය චින්තනය හා සමගාමී වේ. සම්භාව්‍යය ප්ලේටෝ සහ ඇරිස්ටෝටලියානු චින්තනය නූතනත්වය තුළ පරාවර්තනය වන්නේ යම් සේ ද කල්දූන්ගේ අදහස් මාක්ස්, ස්පෙන්සර්, කොම්ටේ වැනි යුරෝපීය චින්තකයන් සමග සහේතුක ව සන්සන්දනය කළ හැකි වේ. ඉබන් කල්දූන් බටහිර සමාජ විද්‍යාව ඇතුළු ව පොදුවේ බටහිර සමාජීය චින්තනය හැඩගැස්වීමෙහි ලා ඍජු ව දායක වූ අයෙකු ලෙස අපට පොදු අර්ථකථනයක් වෙත එළඹිය නො හැකි නමුදු සමාජ-දේශපාලන දාර්ශනිකයෙකු හා ලේඛකයෙකු ලෙස ඔහු සමකාලීන සමාජ චින්තනයට දක්වා ඇති දායකත්වය සුළු පටු නො වේ **(Soyer& Gilbert, 2012)**.

**සමාලෝචනය**

මෙම ශාස්ත්‍රීය ලිපියේ ඉබන් කල්දූන්, ඔහුගේ ජීවන පසුබිම සහ ශාස්ත්‍රීය දායකත්වය පිළිබඳ සංක්ෂිප්ත සාකච්ඡාවක් සිදු කර ඇත. සැබෑ ලෙස ම ඉබන් කල්දූන් යනු කවරෙක් ද? යන පැනය සරල ව ආමන්ත්‍රණය කළ යුතු පැණයක් නො වේ. මන්ද ඔහු දේශපාලන ක්‍රියාකාරිකයෙකු ලෙස මෙන් ම නෛතික ක්ෂේත්‍රය තුළ ද පුරෝගාමී කාර්ය භාරයක් ඉටුකරන ලද බුද්ධිමතෙකු ලෙස සැලකේ. එමෙන් ම සමාජීය සංසිද්ධීන් අළලා ඔහු විසින් අවධාරිත න්‍යායික සාකච්ඡා හා පඨිත මගින් ඔහු සතු සමාජය පිළිබඳ ව පැවති දෘෂ්ටිය කෙබඳු එකක් වී ද යන්න අපට විමසා බැලිය හැකි වේ. ඉස්ලාම් ශාස්ත්‍රීය ලෝකය ඇතුළු ව පොදුවේ පෙරදිග සම්බන්ධ දැනුම් කතිකාවන්හී, ඉබන් කල්දූන්ගේ ස්ථානගත වීම සම්බන්ධ තියුණු ශාස්ත්‍රීය විවාද උත්පන්න වී තිබේ. එනම් ඉබන් කල්දූන් සමාජ විද්‍යාවේ ආදි කර්තෘ හෙවත් පියා ලෙස හඳුනාගන්නා අතර ඔහුගෙන් පසු කාලීන ව ඔගස්ටේ කොම්ට් මූලික වෙමින් බටහිර සමාජ විද්‍යාව බිහි වූ බව එහි එක් තර්කයකි. මේ සම්බන්ධ අනෙක් ප්‍රවාදය වන්නේ ඉබන් කල්දූන් පෙරදිග සමාජ විද්‍යාත්මක ධාරාවේ ආදි පුරෝගාමීයකු බව යි. මෙම විවාදාත්මක මතිමතාන්තර කුමක් වුවත් සමාජ චින්තකයෙකු සහ දේශපාලන ක්‍රියාකාරිකයෙකු ලෙස ඉබන් කල්දූන් සමාජ විද්‍යාවේ න්‍යායික ධාරාවල මතුකර ඇති ආස්ථානය තව දුරටත් පෘථුල සාකච්ඡාවකට ලක් කිරීම වැදගත් වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

Dhaouadi, M., 1990. Ibn Khaldun: **The Founding Father of Eastern Sociology.** New York: Sage.

Fuad, B., 1988. Society, **State and Urbanism: Ibn Khaldun's Socioloical** Thought. Albany: State University of NewYork Press.

Soyer, M.S. & Gilbert, P., 2012. **Debating the Origins of Sociology: Ibn Khaldun as a Founding Father of Sociology**: Mississipi State University: International Journal of Sociological Research.